## චානක ඉලංගගේ 365 දින

ගුවන් විදුලියේ තවත් එක් අපූරු සොයාගැනීමක් වූ රෝහණ බෝගොඩයන් ප්‍රථම වරට රසිකයින් අතරට එනුයේ පිබිදෙන ගායක පරපුර නැමති ගුවන් විදුලි වැඩසටහන හරහාය . එතෙක් මෙතෙක් කාලය තුල තම මියුරු හඬ ඔස්සේ සිංහල ගීතය පෝෂණයෙහිලා තම වගකීම නිසි ලෙස ඉටු කල සංගීත වේදියෙකු වන බෝගොඩයන් ගායනයට සේම වාදණයටද එකසේ දස්කම්පායි.

බෝගොඩ අතින් බිහිවූ මියුරු තනු බොහෝය . ගායක ගායිකාවන්ගේ සංගමයේ හිටපු සභාපතිද වූ රෝහණ බෝගොඩ තමන් ආ ගමන් මග පිළිබඳව සහ ඔහු මෙල්බන් නුවර පවත්වන ලතුන් සිත් ගී ල නැමති ප්‍රසංගය පිළිබඳව සන්නසට තොරතුරු කීවේ මෙන්න මේ ආකාරයටයි .

"මම පාසැල් සිසුවෙකුව සිටි 1973 දී තමයි පිබිදෙන ගායක පරපුර කියන වැඩසටහන සඳහා ඉල්ලුම්පත්‍රයක් දමන්නේ. කෙසේ නමුත් මටත් ගායකයෙකු වෙන්න ඕන කියලා කිසිම දවසක මගේ හිතකවත් තිබුනේ නැහැ .මට හැමදාම ඕන වුනේ දක්ෂ සහ ජනප්‍රිය තබ්ලා වාදකයෙකු වෙන්නයි. ඒ තුලින් ඉදිරියට යන්නයි. පොලිස් දෙපාර්තමේන්තුවේ සේවය කරන කාලයේ නොයෙකුත් සංගීත භාණ්ඩ වාදනය කිරීමට මට අවස්ථාව ලැබුනා. ඒ වගේම පොලිස් නිලධාරියෙකු ලෙස මා ලැබූ පන්නරය සහ විනය මට මහා අත්වැසිල්ලක් උනා කලාකරුවෙකු ලෙස දිගු ගමනක් යන්න.

වර්ෂ 1978 දී තමයි ගුවන් විදුලි සංස්ථාවේ වාදක මණ්ඩලය සමග මම එකතු වන්නේ. එවකට ගුවන් විදුලියේ වාදක මණ්ඩලයේ සේවය කල මගේ මාමගේ පුතා වුනු රන්ජිත් බෝගොඩ තමයි මාව ගුවන් විදුලියට යොමු කරන්නේ. පසුව පැවැත්වුණු සම්මුඛ පරීක්ෂණයෙන් මම සමත් වෙනවා. මට තවම මතකයි එදා ඒ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සිටි සාමාජිකයන් අතර පණ්ඩිත් අමරදේවයන් පවා හිටියා .එතැන ඉදල වසර තිස් පහක කාලයක්ම මම ගුවන්

### බෝගොඩට හොදට සින්දු කියන්න පුළුවන්නේ, ඇයි සින්දුවක් රෙකෝර්ඩ් කරන්නැත්තේ?

විදුලියේ සේවය කළා.

වාදකයෙකු ලෙස මට බොහෝ දක්ෂ සංගීත අධ්‍යකෂකවරු සමග කටයුතු කිරීමට අවස්ථාව ලැබෙනවා. නම් වශයෙන් කියුවහොත් ස්ටැන්ලි පීරිස්, සරත් දසනායක, රොක් සාමි, මුත්තු සාමි , සෝමපාල රත්නායක , වික්ටර් රත්නායක වැනි දක්ෂයින් යටතේ මම තබ්ලාව වාදනය කරනවා. එසේම ජෝතිපාල මහතා කැසට් පට සීයක් කලානම් එයින් අනුවකම මම තබ්ලාව වාදනය කරලත් ඇති. මේ දක්ෂයින් ගේ ඇසුර තමයි මගේ ගමන සාර්ථක වෙන්න බලපෑවේ.

මම ගායකයෙකු වන්නේ අහම්බෙන්. එක්තරා ගීත පටිගත කිරීමක් අතරතුර දී ලද විවේක කාලය තුල මම පියානෝව වාදනය කරමින් හින්දි ගීතයක කොටසක් ගායනා කරනවා. මේක ස්ටැන්ලි පීරිස් හොරෙන් අහගෙන ඉන්නවා. ඉදල මගෙන් අහනවා "බෝගොඩට හොදට සින්දු කියන්න පුළුවන්නේ, ඇයි සින්දුවක් රෙකෝර්ඩ් කරන්නැත්තේ?" කියල. මම කියනවා අනේ මට ඕව බැහැ අනික මම සින්දු කියන්න කැමති නැ කියල. එහෙම කියුවට ස්ටැන්ලි එදාම තනුවක් හදනවා "නෙතින් නෙත බලාලා" ගීතයට. තනුව කරලත් මාස හයක් විතර ගියාට පසුව ප්‍රේමකීර්ති ද අල්විස් පදමාලාවක් ලියුව තනුවට. නමුත් එහි තිබුණු එක්තරා කොටසකට මම අකමැති වුනු නිසා මම මෙය ආපසු ලියවනවා දයා ද අල්විස් නමැති ගුවන් විදුලියේ නිවේදිකාවට කියල. ප්‍රේම් ලියපු

උපදින ඇසිල්ලේ හවේදී මතු
ඇයට පෙර කෙසේ හෝ ඔබයි ආයුතු

කියන කොටසට තමයි මම අකමැති වන්නේ.
ඉතින් දයා ද අල්විස් ඒක වෙනස් කරනවා

දිනන්නට කිසිත් නෑ ලොවේ මින් මතු
මගෙන් නුඹ ඈත් වී ගියායින් පසු.

නෙතින් නෙත බලාලා ගීතය සමග තමයි රෝහණ බෝගොඩ කියන ගායකයා සංගීත ක්ශෙත්‍රයේ ජනප්‍රිය වෙන්නේ. ප්‍රේම් පසුකාලීනව මට ලියනවා කඳුලක් වැටේ නම් පිසලන්න ආයේ,එකම මොහොතක එකට ඉපදී වගේ මගේ ජනප්‍රිය ගීත කීපයක්ම. මලක සුවඳ පතා කියන ගීතය මට රචනා කරනුයේ එවකට නාවික හමුදා සෙබලෙක් අද රටේ ප්‍රසිද්ධ චරිතයක් වන විජිත රෝහණ විජිතමුණි කියන පද රචකයා. මේ ගීතයත් රසිකයින් ඉතාම ආදරයෙන් වැළඳගත් මගේ ගීතයක්

ගායකයෙකු ලෙස මට පුළුල් වපසරියක් තුල ගායනය කරන්න හැකිවීම පිළිබඳව මම නිහතමානීව සතුටු වෙනවා. මම සරල ගීතය සේම ශාස්ත්‍රීය ගීතත් ගායනය කරනවා. ඊට අමතරව ප්‍රසංග වේදිකාවට සරිලන ගීතත් ගායනා කරනවා. එතනින් එහාට නූර්ති සහ කෝලම් සම්ප්‍රදායට නැතිනම් ජන සංගීතයේ අභාෂය සහිත ගීතත් ගායනා කරනවා. එපා කෝපා පණෝ වගේ ගීතයක් ගතහොත් කෝලම් සම්ප්‍රදායෙන් බිහිවුණු ගීතයක් . මේ ගීතය මම ප්‍රසංග වේදිකාවේදීත් ගයනා කරනවා . දිවි කතරට ගංගාවයි. නෙතු පෙලා රවටලා.ඔබටයි මේ ආරාධනා. සියොතුන් ඉගිලගියා . සුසුමේ සුවඳක් වෙලා . වැනි ගීත එදා වගේම අදටත් එකසේ ජනප්‍රියයි. මේ ජනප්‍රියත්වයට හේතුව මගේ හඬ පමණක්ම නොවෙයි මේ ගීතවල අඩංගු පදමාලා සහ ගීත තනුත් එකසේ බලපෑව මෙම ගීතවල පැවැත්ම සඳහා. තවත් පැත්තකින් එදා තිබුන රසික විඥානයත් මේ ගීතවල පැවැත්ම සදහා බලපෑවා කියල මට හැගෙනවා.

මේ ශේත්‍රය තුල මට නොලැබුන එකම දෙය ,චිත්‍ර පටයකට සංගීතය සැපයීමට නොහැකිවීම පමණයි. නමුත් චිත්‍රපට අටක නමයක පමණ මම පසුබිම් ගායනයෙන් දායක උනා. පළමු චිත්‍රපට උනේ මා ඔබේ හිතවතා .එතනින් එහාට ගුරු ගෙදර .ලදුනි ඔබ දෙවඟනකි වැනි චිත්‍රපට කීපයකටම මට ගායනයෙන් සහභාගි වෙන්න අවස්ථාව ලැබෙනව. ටෙලිනාට්‍ය ක්ශෙත්‍රයේත් ටෙලි නාට්‍ය කීපයකටම ගායනයෙන් සහ සංගීත අද්‍යක්ෂණයෙන් දායක වෙන්න මට හැකිවෙනවා. හිරුට මුවාවී . අම්මා වරුන්ගේ දරුවෝ වගේ ටෙලිනාට්‍ය මතක් කරන්න පුළුවන් . මේ අතර හබර්ට් රන්ජිත් පීරිස්ගේ හිරුට මුවාවී ටෙලිනාට්‍යට මමත් දමයන්ති ජයසූරියත් එක්ව ගැයූ ඔබට හොරා ඔබ වෙත සෙනෙහස පා ගීතය එදාවගේම අදත් ඉතාම ජනප්‍රියයි.

මා ගායක ගායිකාවන්ගේ සංගමයේ සභාපතිව හිටිය කාලය තුල මාගේ මුලික අභිප්‍රාය වුයේ අපේ සංගමයට ලිපිනයක් නැතිනම් ස්ථිර ගොඩනැගිල්ලක් සාදාගනීමයි . මේ උත්සාහය සඵලවීගෙන එනකොටම තමයි රජය වෙනස් වෙන්නේ. කෙසේ නමුත් එච් .එන් .බී ඇෂුවරන්ස් සමාගම සමග එක්ව අද ඉතාම අසරණ තත්වයට පත්වෙලා ඉන්න කලාකරුවන් සත් දෙනෙකු සදහා මගේ මූලිකත්වයෙන් අප සංගමය හරහා රුපියල් ලක්ෂය බැගින් වූ මුදල් ආධාරා හතක් ලබාදීමටත් හැකිවෙනවා. දැන් මගේ කාලය අවසන් . අපේ වර්තමාන සභාපති කීර්ති සහෝදරයා ඒ කටයුතු නිවැරදිව ඉදිරියට කරගෙන යනවා .

සංගීතය කියන්නේ ප්‍රඥාගෝචර විෂයක් . මගේ ගීතවලට පුළුවන් උනානම් කෙනෙකුගේ අවිවේකී බව නැති කරන්න . වේගවත් ජීවිත වළට නිවුණු බවක් දෙන්න . කෙනෙකුව ගීතයෙන් සමාධි ගත කරවන්න සංගීතඥයෙකු ලෙස මගේ උත්සාහය එයයි .

කෙටි නිහැඬියාවකට පසුව මේ දිනවල මම ඕස්ට්‍රේලියාවේ මෙල්බන් නුවර ප්‍රසංගයක් සඳහා ලැහැස්ති වෙනවා. ප්‍රසංගයේ නම තුන් සිත් ගී. මෙහිදී මාත් සමග ගායනයෙන් ප්‍රවීණ ගායන ශිල්පිණී ඇන්ජලින් ගුණතිලක සමග ගායන ශිල්පී චන්ද්‍රසේන හෙට්ටිආරච්චි එකතු වෙනවා . ඉතින් ඔබ ඉන්නේ මෙල්බන් නුවරනම් මම ආරාධනා කරනවා ඔබ සැමට එන්න රිංග්වුඩ් හී ජෝර්ජ් වුඩ් රංග ශාලාවට මැයි 28 සවස 6.30 ට. තුන් සිත් ගී සමගින් අපි එදාට හමුවෙමු .

ලැබෙනවා අවස්ථාව තරගය සඳහා ඉදිරිපත් වෙන්න. තරගය තරග වට හතකින් සමන් විත වෙනවා. අටවෙනි වටය තමයි අවසාන මහා තරගය පැවැත්වුනේ. මේ අවසාන තරගය පැවතියේ කොළඹ රාජකීය විද්‍යාලයේ නව රඟහලේ. තරගය තුළ මට විශේෂ යමක් කිරීමට හැකිවෙනවා. ඒ තමයි පළමු තරග වට හත තුලම මම ගායනාකලේ මගේම ස්වතන්ත්‍ර නිර්මාණ වීම. මේක එක පැත්තකින් මම මටම එල්ල කරපු අභියෝගයක් උනා. තවත් පැත්තකින් තරගය තුල මම විහින්ම ඇති කරගත් අවදානමක්ද උනා. කෙසේනමුත් මට තරගය ජයග්‍රහණය කිරීමට හැකිවෙනවා. තරගය පුරාවටම මට අලුත් පද මාලා ලබාදුන් මගේ ආදරණීය සහෝදරියගේ සැමියා වුනු ක්‍රිස්ටි ගුණසේකරත් එම පදමාලා සදහා තනු සකසාදුන් මගේ සහෝදරයා වුනු විනී බෝගොඩවත් අමතක කරන්න බෑ .

අදටත් මම ආඩම්බර වෙනවා මම එදා ගත්තු ඒ නිවැරදි තීරණය මගේම පදමාලාවන් පමණයි මම ගයන්නේ කියන තීරණය පිළිබඳව .ඒ නිසා නිවැරදි විදිහට මේ ගමනට අවතීර්ණ වෙන්න පුළුවන් උනා .ඒ ආපු ගමනේ ප්‍රතිපල මම දැන් බුක්ති විඳිනවා .

කුඩාකල සිටම සංගීතය සමග ලොකු බැඳීමක් තිබුනා .පුංචිකාලේ ඉදලම ඇහුනේ සංගීතයම තමයි. අයියලා දෙදෙනෙක්ම සංගීත ගුරුවරු උනා. ඒ දවස් වල ඉතින් ඔය අයියලාගේ බජව්වලට එහෙමත් යනවා. අයියලාගේ සංගීතභාණ්ඩ එහෙම අයියල නැති උනාම මගේ වගේ තමයි. ඊට අමතරව අයියලා සංගීත විභාග වලට යද්දී මමත් තබ්ලාව ගහලා ඒ වැඩට උදවු කරනවා. ඔය විදිහට මටත් පුදුමාකාර ආසාවක් තිබුනා එදා ඉදලම මේ සංගීත ශේත්‍රයට එන්න. මට ඇත්තටම ඕන වුනේ කවදාහරි දක්ෂ තබ්ලා වාදකයෙක් වෙන්න. ඒක තමයි මට තිබුන ලොකුම හීනය. පාසල තමයි මගේ පළමු වේදිකාව උනේ තබ්ලා වාදකයෙකු වෙන්න. පාසලේ තුර්‍ය වාදක කණ්ඩායමේ සහ නොයෙකුත් උත්සව අවස්ථා වලත් මම තබ්ලාවෙන් දස්කම් දක්වලා තියෙනවා .මට දැනෙන විදිහට තබ්ලා වාදනය කියන එක මම උපතින්ම රැගෙන ආපු මගේ ලේ වලම තියෙන දෙයක්.
සංගීතය කියන විෂය මට කවදාවත් ආගන්තුක උනේ නැහැ. මම හැදුනේ වැඩුනේ ජීවත් උනේ සංගීතයත් එක්කමයි. අදටත් ඉතින් එක එහෙමම තමයි .

වර්ෂ 1975 දී තමයි මම පොලිස් දෙපාර්තමේන්තුවේ තූර්ය වාදක කණ්ඩායම සමග සමග එකතු වන්නේ. වසර තුනක පමණ සේවා කාළයකින් පසුව මම පොලිස් දෙපාර්තමේන්තුවෙන් ඉවත් වෙනවා. ඒ ඉවත් වන්නේ ඇත්තට ගුවන් විදුලි සංස්ථාවේ වාදක මණ්ඩලය සමග පූර්ණ කාලීනව වැඩ කිරීමේ බලාපොරොත්තුවෙන්.

# මම හැදුනේ වැඩුනේ සංගීතයත් එක්කමයි

## රෝහණ බෝගොඩ

